**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2020**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍යකාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 76 ඡේදය (ඇ) ප්‍රකාරව වාර්තා කරන දිනෙන් පසුව මාස 12 ක් තුළ දී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන එකතුව රු.429,868,066 ක් වූ ස්ථාවර තැන්පතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවත්, ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | අප විසින් ස්ථාවර තැම්පතුවල මුදල් ආයෝජනය කරනුයේ වාර්ෂිකව ස්වයංක්‍රීයව අළුත්වන (Auto Renewal) පදනම යටතේ දීර්ඝ කාලීන ආයෝජන ප්‍රතිලාභ ඇරීමේ අභිලාෂයෙන් වන බැවින් දීර්ඝ කාලයක් මුළුල්ලේම ස්ථාවර තැම්පතු ආයෝජනය ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය වාර්ථාවල ඉදිරිපත් කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අප විසින් අනුගමනය කරන ලදි. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව 2010 සහ 2011 වර්ෂවලදී ප්‍රත්‍යාගණනය කරන ලද රු.15,116,057 ක් වටිනා වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එම වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂය තුළ පැවති වසංගත තත්වය හේතුවෙන් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමක් සිදු නොවූ අතර ඉදිරියේදි ඒ සඳහා කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016/2017 සහ 2017/2018 අධ්‍යයන වර්ෂයන් සඳහා ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායම් ලෙස හඳුනාගත් රු.11,223,850 ක් අතීතානුයෝගීව ගැලපීම වෙනුවට වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අප විසින් ලැබිය යුතු පාඨමාලා ගාස්තු ගිණුම්ගත කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුගමනය කරනු ලැබුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ සිටය. එදිනට හඳුනා ගැනීමට නොහැකි වූ 2020 දෙසැම්බර් 31 දිනට පැවති අය කරගත යුතු සියළුම පාඨමාලා ගාස්තු 2020 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු පාඨමාලා ගාස්තු තුළ ඇතුළත් කර ඇත. | ආදායම් හඳුනා ගැනීමේදී ආදායම් ජනනය වූ කාලයට අදාළව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2017 දෙසැම්බර් 31 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා Short Course, Workshop & Other සඳහා ගෙවිය යුතු ශේෂ 15 කට එකතුව රු.2,117,843 ක් සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් කර නොතිබුණි. | එම ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට හා පියවීමට අපොහොසත් වන ශේෂයන් නිසි අනුමැතියන්ට යටත්ව Work Shop & Event Fund වෙත මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු වියදම් කඩිනමින් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| පනත් | | | |
| 1971 අංක 38 දරන මුදල් පනතේ 08(i) වගන්තිය | සෑම මුදල් වර්ෂයක් ආරම්භවීමට මාස 03 කට පෙර අයවැය ලේඛනයක් පිළියෙල කර පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අප විසින් ඉදිරි වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු රාජ්‍ය අයවැය ලේඛන පිළියෙල කිරීමට මාස 4 කට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අප වෙත වෙන් කරන ලද පුනරාවර්තන ප්‍රදාන හා ප්‍රාග්ධන ප්‍රදානයන් අප වෙත දැනුම් | මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

දෙන්නේ දෙසැම්බර් මාසයේදිය. ඒ අනුව විගණනය පෙන්වා දී ඇති ආකාරයට මාස තුනකට පෙර අයවැය ලේඛනය පිළියෙල කිරීමේ හැකියාවක් නොමැත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,838,955 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.40,804,151 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,965,196 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට පාඨමාලා ගාස්තු රු.39,861,425 කින් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2002 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ආයතනයේ අරමුදල් වරින්වර ස්ථාවර තැන්පතු 24 ක ආයෝජනය කර තිබූ අතර ආයතනයෙහි මුදල් ඉතා දීර්ඝ කාලීනව ස්ථාවර තැන්පතු ලෙස රඳවා ගනිමින් බැංකු පොලී ආදායම් ලබන බව නිරීක්ෂණය විය. එම අරමුදල් ශිෂ්‍ය අධ්‍යාපනය සහ සුභසාධනය සාක්ෂාත් වන පරිදි විධිමත් සහ ඵලදායී අයුරින් යෙදවීම තුළින් වැඩි සිසුන් සංඛ්‍යාවකට පශ්චාත් උපාධි හැදෑරීම සඳහා අවස්ථා ලබාදිය හැකිව තිබුණි. | සියළුම ප්‍රාග්ධන වියදම් දරා ඇත්තේ ශිෂ්‍යය අධ්‍යයන කටයුතුවලට පහසුකම් සැපයීම වෙනුවෙනි. ඒ අනුව අප විසින් උපයා ගන්නා ලද බැංකු පොලී සහ අනෙකුත් ආදායම් ඉතා ඵලදායි ආකාරයට ශිෂ්‍යන්ගේ පශ්චාත් උපාධි කටයුතු සඳහා උපයෝජනය කර ඇත. | වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට පශ්චාත් උපාධි හැදෑරීමට හැකිවන අයුරින් පාඨමාලා ගාස්තු අඩු කර ශිෂ්‍ය අධ්‍යාපනය සහ සුභ සාධනය ඉහළ නැංවෙන පරිදි අරමුදල් උපයෝජනය කිරීමට කළමනාකරණය අවධානය යොමු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කරන ලද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන අත්පොතේ 7 වන නිර්ණායකය අනුව ආයතනය විසින් පවත්වනු ලබන විභාග සැලැසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, ඒවා වැඩි දියුණු කිරීම, හරි වැරදි බැලීම, | උත්තර පත්‍රවල දෙවෙනිවර හරි වැරදි බැලීම වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය සහිතව හඳුන්වා දී ඇති ක්‍රමවේදයන් අප ආයතනය මඟින් අනුගමනය කෙරේ. 1991 අංක 01 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතනය නියමාවලියේ උපඡේද 11(2)i යටතේ දැක්වෙන පරිදි, මෙම ක්‍රමවේදයන් | අදාළ මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන නිශ්චිත ක්‍රමවේදයක් සහ ප්‍රමිතීන් සකස් කර පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවද, පාලක සභාවේ අනුමැතිය පමණක් ලබාගෙන තිබුණි. | ක්‍රියාවට නැංවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අවශ්‍ය නොමැති අතර විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ප්‍රමාණවත් බව | |
| (ආ) | පශ්චාත් උපාධි ආයතනයේ 2016-2018 දක්වා කාලය තුළ ලියාපදිංචි වූ සිසුන් 1052 කුගෙන් පාඨමාලාව අවසන් කළ යුතු උපරිම කාල සීමාව තුළ පාඨමාලා අවසන් නොකළ සිසුන් සංඛ්‍යාව 756 ක් හෙවත් සියයට 72 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | 2016/2017, 2017/2018, 2018/2019 අධ්‍යයන වර්ෂවල සිසුන්හට නියමිත කාල වකවානුව තුළ පාඨමාලා අවසන් කිරීමට නොහැකි වීම නොවැළැක්විය හැකි හේතූන් මත දීර්ඝ විය. රටේ පැවතුන ආරක්ෂක තත්වය සහ පවතින Covid වෛරස තත්වය මෙම සිසුන්ගේ පර්යේෂණ කටයුතුවලට බොහෝ සේ බලපා ඇති බවත් පර්යේෂණ සඳහා වන ගවේෂණ කටයුතු, පර්යේෂණාගාර කටයුතු බොහෝ අවස්ථාවලදි නතර වී ඇත. | නියමිත කාල සීමාව තුළ පාඨමාලාව අවසන් කිරීම කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කළ යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ හා ශිෂ්‍යත්ව පහසුකම් ලබාදීම සඳහා 2018 වර්ෂයේදී ආරම්භ කර තිබූ අරමුදලෙන් මේ දක්වාම කිසිදු ශිෂ්‍යත්ව හෝ පර්යේෂණ කටයුත්තක් සඳහා වියදම් දරා නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන වන විට එම අරමුදලේ රු.7,771,002 ක ශේෂයක් විය. | විගණනය පෙන්වා දී ඇති රු. 7,771,002 ක ශේෂය පදනම් කරගෙන එක් පර්යේෂණයක් සඳහා රු.500,000 ක් බැගින් පර්යේෂණ ව්‍යාපෘති 12 ක් සඳහා පර්යේෂණ ප්‍රදාන කළමනාකරණ මණ්ඩල අනුමැතිය යටතේ මේවන විට ප්‍රදානය කර ඇත. පර්යේෂණ යෝජනා ඉල්ලුම් පත්‍ර විශ්ලේෂණය කර ගැනීමට ගත වූ කාලය යෝජිත කාලයට වඩා ඉක්ම විය. එසේම සමහර පර්යේෂණ ඉල්ලුම් පත්‍ර විශ්ලේෂකයන්ගේ උපදෙස් මත නැවත විශ්ලේෂණ කරගෙන යනු ලැබේ. | අරමුදල් ලැබී ඇති කාර්යයන් සඳහා කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | පර්යේෂණ කටයුතු සඳහා ලබාදී තිබූ රු.2,353,608 ක් වූ පර්යේෂණ අරමුදල් 08 ක් 2020 වර්ෂය තුළ ඌන උපයෝජිතව තිබුණි. | එක් පර්යේෂණ අරමුදල් තුනක ශේෂ මේ වන විට පියවා අවසන් කර ඇත. පර්යේෂණ අරමුදල් 02 ක් අවසන් වී ඇති අතර එහි ඉතිරි ශේෂය පශ්චාත් උපාධි පර්යේෂණ හා විශේෂිත අරමුදලට මාරු කරන ලෙස අදාළ ආචාර්යවරුන් විසින් ඉල්ලා ඇති | අරමුදල් ලැබී ඇති කාර්යයන් සඳහා කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | පර්යේෂණ අරමුදල් 03 ක ශේෂයන් පවතින අතර 2020 වර්ෂය තුළ පැවති Covid වසංගත තත්වය හේතුවෙන් පර්යේෂණ කටයුතුවල අඩාල වීම් හේතු කොටගෙන ඇතැම් පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාළ ගෙවීම්වල යම් අඩුවීමක් සිදුවී ඇත. | |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2019 වර්ෂයේදී අනුමත කාර්යය මණ්ඩලය හා තත්‍ය කාර්යය මණ්ඩලය සැසදිමේදී තනතුරු 09 ක පුරප්පාඩු 11 ක් සහ තනතුරු 02 ක අතිරික්ත 05 ක් පැවතුණි. පවත්නා පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමට සහ අවශ්‍යතාවය අනුව අතිරික්ත තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීමට හෝ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආයතනයේ 2017 වර්ෂයේ අනුමත සේවක සටහනට අනුව අධ්‍යයන තනතුරු පුරප්පාඩු 7න් 3 ක් මේ වන විට පුරවා ඇති අතර තාවකාලික පර්යේෂණ සහකාර තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බවත් අනෙකුත් තනතුරු පුරප්පාඩුවලට බඳවා ගැනීම් සිදුකරනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත ආයතනයේ අවශ්‍යතාවය හා පිරිවැය ප්‍රමාණයට අනුකූලවය. | පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කිරීමටත්, අතිරික්ත තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීමටත් කඩිනමින් කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම්/වියදම් සමඟ තත්‍ය ආදායම්/වියදම් සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 17 සිට සියයට 27 දක්වාත් වියදම් විෂයයන් 05 ක සියයට 21 සිට සියයට 86 දක්වාත් විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | රට තුළ පැවති Covid වසංගතය තත්වය යටතේ වුවද සාපේක්ෂව විචලනය අවම මට්ටමක පවත්වා ගනිමින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට විද්‍යා පශ්චාත් උපාධි ආයතනය කටයුතු කර ඇති බව | තාත්ත්වික අයවැය ලේඛනයක් පිළියෙල කර ඊට අනුගත විය යුතුය. |